03 OCT 1988

# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 18 දරන

# රුහුණු සංස්කෘතික මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූනි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 ජූනි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1988 අංක 18 දරන රුහුණු සංස්කෘතික මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූනි මස 22 වන දින]

**එල්. ඩී.—ඕ. 36/86**

### රුහුණු සංස්කෘතික මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"රුහුණු සංස්කෘතික මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී මණ්ඩලයට සම්බන්ධ සියළු පරමාර්ථ හා කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සහ ක්‍රියාත්මක කරගෙන යාමට හැකි වන පරිදි ඒ සංගමය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1988 අංක 18 දරන රුහුණු සංස්කෘතික මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රුහුණු සංස්කෘතික මණ්ඩලය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මකවන දින සිට සහ ඉන්පසුව (මෙහි මින් මතු 'මණ්ඩලය' යනුවෙන් සඳහන් කරනු ලබන) රුහුණු සංස්කෘතික මණ්ඩලයේ දැනට සාමාජිකයින්ව සිටින්නා වූ ද මේ පනතේ පළමුවන උපලේඛනයෙහි නම් සඳහන් වන්නා වූ ද තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන් "රුහුණු සංස්කෘතික මණ්ඩලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ හා අරමුණු.

**3.** සංස්ථාව සංස්ථාපිත කරනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) රුහුණු සංස්කෘතියට අදාළ වන අධ්‍යාපන, කලා ශිල්ප, නැටුම්, ගැයුම් හා වැයුම් වර්ධනයට හා අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය වැඩ පිළිවෙළවල් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

ඒ 091046—7,460 (86/07)

(ආ) සාමාජිකයන්ගේ හා අනුබද්ධ ආයතනවල අධ්‍යාපනික, සංස්කෘතික, සුභසාධන හා ක්‍රීඩා කටයුතු වර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඇ) සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවා පවත්වාගෙන යෑම ; සහ

(ඈ) ඉහත කී පරමාර්ථ ඉටුකර ගැනීමට හිතකර හෝ ආනුෂංගික වන වෙනත් සියළු ක්‍රියා හා දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනවල යෙදවීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියළුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියළු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේය.

පාලක මණ්ඩලය.

5. (1) සංස්ථාවේ නිලධරයන් සහ සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වන පාලක මණ්ඩලයක් විසින් එකී රීති වලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරතුවම වූ දිනයේදී මණ්ඩලයේ පාලක මණ්ඩලයේ ධුර දැරූවා වූද, මේ පනතේ දෙවන උපලේඛනයෙහි නම් සඳහන් කර ඇත්තා වූ ද සාමාජිකයින්ගෙන් සමන්විත වූ පාලක මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයින් ඇතුලත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම සඳහා ද සංස්ථාවේ පාලක මණ්ඩලයේ, ඒ මණ්ඩලය විසින් පත් කරනු ලබන යම් අනුකාරක සභාවක සාමාජිකයන්ගේ, සංස්ථාවේ ඒ ඒ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාම සඳහා ද සංස්ථාවේ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා සහ සංස්ථාවේ කටයුතු කරගෙන යෑම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල සාමාජිකයින්ගේ මහා සභා රැස්වීමකදී ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේය. එසේ සාදනු ලැබූ රීති, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගනයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත්, දැරීමටත් සංස්ථාවට නීතියෙන් බලය ඇත්තේ ය. තවද ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් නියෑදනය කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව එකී සියලු දේපළ දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. (1) සංස්ථාවේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් ද පිළිබඳව සහ සංස්ථාවේ අනිකුත් සියලුම ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් කටයුතු යෙදිය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාවේ ගිණුම්, සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් විගණනය කරනු ලැබිය යුතුය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී මණ්ඩලයෙහි පවත්නා සියළු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර මණ්ඩලයට අයවියයුතු සියලුම ණය සහ මණ්ඩලය වෙත ගෙවිය යුතු සියළුම දායක මුදල් සහ සම්මාදම් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින් ගෙවිය යුතු හා මණ්ඩලයට අයවිය යුතු ණය.

10. සංස්ථාවේ පාලක මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ නම නම් අත්සන් කළ යුතු ය. එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනා යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුලත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

## පළමුවන උප ලේඛනය [2 වන වගන්තිය]

(1) ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි, ශ්‍රී රතනජෝති පිරිවෙන, උඩුගම්පොල, නිහලේගොඩ.

(2) ඩී. ජී. දයාරත්න මහතා, 39, විමලවන්ත පාර, නුගේගොඩ.

(3) මහාචාර්ය එම්. බී. ආරියපාල මහතා, 146/26, හැව්ලොක් පාර, කොළඹ 5.

(4) ගුණපාල වික්‍රමරත්න මහතා, 434/2, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

(5) මහාචාර්ය වියුලි ද සිල්වා මහතා, 451/75, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

(6) චන්ද්‍රා ඩී. පෙරුම්පුලි මහතා, 24/1, පැලවත්ත පාර, නුගේගොඩ.

(7) ඊ. බණ්ඩාරගේ මහතා, 'සුමාලි', දිබ්බැද්ද පාර, නල්ලුරුව, පානදුර.

(8) දයා රාමනායක මහතා, 842/3, වැකන්ද පාර, කොළඹ 2.

(9) එස්. බී. බන්දුසේන මහතා, 152/2ඩී, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

(10) බී. පී. ගාමිණී ජයදේව මහතා, 602/3, හැව්ලොක් පාර, කොළඹ 6.

(11) සුගත් කොඩිතුවක්කු මහතා, 67, බාන්ස් පෙදෙස, කොළඹ 7.

(12) තිලක් අබේසිංහ මහතා, 128/1, උයන පාර, උයන, මොරටුව.

(13) ආචාර්ය එච්. ඒ. පී. අභයවර්ධන මහතා, ඕ40, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 5.

(14) සී. ඩබ්ලිව්. අබේවික්‍රම මහතා, 55/6, පතිරගොඩ පාර, පමුණුව, මහරගම.

(15) ආර්. කේ. චන්ද්‍රානන්ද ද සිල්වා මහතා, 615 බී/1, රාජගිරිය උද්‍යානය, රාජගිරිය.

(16) වෛද්‍ය උපුල් විජයවර්ධන මහතා, 25ඒ, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 5.

(17) ආචාර්ය වර්ණසේන රාසපුත්‍ර මහතා, 206, බැන්ක් හවුස්, බෞද්ධාලෝක මාවත, කොළඹ 7.

(18) ආනන්ද සී. ශ්‍රෙරෝ මහතා, විනිසුරු නිල නිවාස, වෙරළ පාර, මාතර.

(19) සරත් විජේසිංහ මහතා, 69/26, කෝට්ටේ පාර, බොරැල්ල.

(20) ලාල් හේවාපතිරණ මහතා, 361/6, කෝට්ටේ පාර, නුගේගොඩ.

(21) සෝමදාස පතිරණ මහතා, 6, සුරනිමල පෙදෙස, කොළඹ 6.

(22) නන්දසේන බඹරවානගේ මහතා, 24, කටුවාවල, බොරලැස්ගමුව.

(23) මහාචාර්ය කීර්ති දිසානායක මහතා, 55, මිරිහාන, නුගේගොඩ.

(24) එල්. එල්. ආරියදාස මහතා, 101, පියදාස සිරිසේන මාවත, කොළඹ 10.

## දෙවන උප ලේඛනය [5 (2) වගන්තිය]

**ගරු සභාපති :**

ඩී. ජී. දයාරත්න මහතා, 39, විමලවන්ත පාර, නුගේගොඩ.

**ගරු උප සභාපති :**

ආචාර්ය එච්. ඒ. පී. අභයවර්ධන මහතා, ඕ40, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.

**ගරු ලේකම් :**

ලාල් හේවාපතිරණ මහතා, අංක 361/6, කෝට්ටේ පාර, නුගේගොඩ.

**ගරු උප ලේකම් :**

එස්. බී. බන්දුසේන මහතා, අංක 452/2ඩී, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

**ගරු භාණ්ඩාගාරික :**

ඊ. බණ්ඩාරගේ මහතා, "සුමාලි", දිබ්බැද්ද පාර, නල්ලුරුව, පානදුර.

කාරක සභාව :

ආචාර්ය කඹුරුපිටියේ වනරතන හිමි, ශ්‍රි රතනජෝති පිරිවෙන, ඌරාපොල, තිහගොඩ..

මහාචාර්ය එම්. බී. ආරියපාල මහතා, 146/26, හැව්ලොක් පාර, කොළඹ 5.

මහාචාර්ය විසුලි ද සිල්වා මහතා, 451/75, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

මහාචාර්ය කීර්ති දිසානායක මහතා, 55, මිරිහාන, නුගේගොඩ.

ආර්. කේ. චන්ද්‍රානන්ද ද සිල්වා මහතා, 615 බී/1, රාජගිරිය උද්‍යානය, රාජගිරිය.

ගුණපාල වික්‍රමරත්න මහතා, 434/2, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

වෛද්‍ය උපුල් විජයවර්ධන මහතා, 25ඒ, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 5.

චන්ද්‍ර බී. පෙරුම්පුලි මහතා, 24/1, පැලවත්ත පාර, නුගේගොඩ.

තිලක් අබේසිංහ මහතා, 128/1, උයන පාර, උයන, මොරටුව.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.